**සී/ස බී.සී.සී.ලංකා සමාගම - 2022/2023**
**-------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සී/ස බී.සී.සී.ලංකා සමාගමේ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 දෙසැම්බර් 17 දිනැති අංක 15/1874/702/010-VII දරන සහ 2016 අප්‍රේල් 20 දිනැති අංක 16/0597/731/009-I දරන අමාත්‍ය මණ්ඩල තීරණ මගින් සමාගමට අයත් අක්කර 6ක බිම් කොටසක් 2019 වර්ෂයේදී කොළඹ අධිකරණ පියස ඉදිකිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත පවරා, මෙම ඉඩම 2022 වර්ෂයේදී රු.මිලියන 7,229 කට තක්සේරුකර තිබුණි. අමාත්‍යාංශය විසින් ගෙවන ලද වරිපනම් රු.මිලියන 21 ක් අඩු කර රු.මිලියන 7,207 ක් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණ ද එම වත්කම ඉවත්කිරීමෙන් ජනිත වූ උපලබ්ධි නොවූ ලාභය රු.මිලියන 3,389 ක් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන ලාභයක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | 2023/2024 ගිණුම් වසරේදි නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත. | අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

#### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු ණයගැති තුළ ඇතුලත් වසර 12 කට වඩා වැඩි කාලයක සිට හා වසර 05 කට වඩා වැඩි කාලයක පැවත එන පිලිවෙලින් එකතුව රු.1,119,956 ක හා එකතුව රු.7,157,381ක ශේෂයන් අයකර ගැනීමට සමාගමට මෙතෙක් නොහැකි වී තිබුණි. | ශේෂ කිහිපයක් විගණන හා කළමණාකරණ කමිටුවෙන් හා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියෙන් කපා හරින ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලැබී ඇත. අනෙකුත් ශේෂ ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | ශේෂ අයකර ගැනීමට හෝ උපදෙස් පරිදි කපාහැරීමට කටයුතු කළ යුතුය. |

#### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 වර්ෂයේදී කළුබෝවිටියාන තේ සමාගමෙන් රු.10,000,000 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර, සමාගමෙන් ලබාගත් රු.10,000,000 ක ණය මුදල 2022 ජුනි මස නිරවුල් කර තිබුණ ද, ගෙවිය යුතු පොලිය රු.51,574,327 ක් නිරවුල් කර නොතිබුණි. තවද, 1985, 2002 හා | පොල් සංවර්ධන අධිකාරිය, කළුබෝවිටියන තේ සමාගම සමග පැවති සාකච්ඡාවේදී පොල් සංවර්ධන අධිකාරියේ ගනු ලැබූ රු. 58,265,037ක ණය මුදල මහා භාණ්ඩාගාරය වෙත ගෙවන ලෙස උපදෙස් ලැබුනු අතර ඒ සඳහා වන රු.61,177,036.60 පොලිය කපාහැරීමට තීරණය විය. | ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2004 යන වර්ෂ වලදී පොල් සංවර්ධන අධිකාරියෙන් ලබා ගත් රු.58,265,037 ක මුදල හා පොලිය රු.61,177,037 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | එසේම කළුබෝවිටියන තේ සමාගමට ගෙවිය යුතු රු.51,118,341.40 ක පොලිය ඉතා ඉහල අගයක් බැවින් ඉදිරියේදී එම මුදල කපා හැරීමට කටයුතු කරන බව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. | |
| (ආ) | වර්ෂ 11 කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.40,479,328 ක ගෙවිය යුතු වරිපනම් බදු, ආරක්ෂක බදු, භාණ්ඩ හා සේවා බදු, වැට් බදු ශේෂ හා ණයහිමි ශේෂ නිරවුල් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. | බී සී සී ලංකා ආයතනය ආයෝජනය කර ඇති ස්ථාවර තැන්පතු කල් පිරෙන විට ඒවා අවලංගු කර අදාල ගෙවීම් කිරීමට කටයුතු කරන ලෙස මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා දී ඇත. | ණය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය | (i) සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාගම විසින් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2023 ඔක්තෝබර් 20 දින එනම් මාස 4 ක් හා දින 20 ක ප්‍රමාදයකින් පසු විගණනයට ඉදිරිපත් කරන ලදී.<br>(ii) 2023 ඔක්තෝබර් 25 දින තෙක් කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණනයට ඉදිරිපත් නොකරන ලදී. | මූල්‍ය ප්‍රකාශන නිසි වේලාවට අවසන් කිරීමට නොහැකි විමත් ආයතනය ප්‍රතිව්‍යුහගත කිරිමේ ලැයිස්තුවට ඇතුලත්විම නිසා මුදල් අමාත්‍යාංශයට පවරා ගැනීමටත් සිදුවීම නිසාය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 149,169,835ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 124,752,053 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.24,417,782 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් පිරිවැය රු.63,459,173 කින් වැඩි වුවද මුළු ආදායම රු.82,643,648 කින් වැඩි වීම හා මුළු වියදම රු.5,822,505 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ ප්‍රධාන කාර්යාලයේ හා වතුපිටිවල පරිශ්‍රයේ පිළිවෙලින් රු.867,253ක හා රු.862,967 ක වටිනාකමැති තොග අයිතම 26 ක් වසර කීපයක සිට භාවිතයට ගෙන නොතිබුණු අතර ඒවා තොගයෙන් ඉවත්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සමාගම මෙතෙක් කටයුතු කර නොතිබුණි. | ඔයිල් නිෂ්පාදනයට අයිති බෝතල්, පෙට්ටි, ලේබල් ටෙන්ඩර් කැඳවා විකිණීමට අදහස් කරනු ඇත. ඒ වගේම තාර බැරල් නිෂ්පාදනයට යොදාගන්නා ඒවාද ඉදිරියේ දි විකිණීමට තීරණය කර ඇත.<br>වතුපිටිවල තොගය 2023/2024 වසරේ ඉවත් කිරීමට කටයුතු යොදනු ඇත. | භාවිතයට ගත නොහැකි තොග ඉවත්කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සම්පූර්ණයෙන් ක්ෂය වී ඇතත් දැනට භාවිතයේ පවතින පිරිවැය රු. මිලියන 48.9 ක් වූ දේපල පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | මෙම වත්කම් අතර දැනට පාවිච්චි නොකරන යන්ත්‍ර සූත්‍ර විශාල ප්‍රමාණයක් මේ වන විට ඉවත් කර ඇති අතර, සම්පූර්ණයෙන් ක්ෂය වූ දැනට පාවිච්චි කරන ඉතිරි වත්කම් සියල්ලම 2023/2024 ගිණුම් වසරේදී ප්‍රත්‍යාගණය කිරීමට කටයුතු කරනු ඇත. | වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර ගිණුම් වල අවශ්‍ය ගැලපීම් කිරීමට කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ හා වතුපිටිවල පරිශ්‍ර තුල පිහිටි වර්ග අඩි 110,010 කින් යුත් ගබඩා 29 ක් හා මෙට්‍රික් ටොන් 3600ක ධාරිතාවයකින් යුත් තෙල් ටැංකි 4ක් පැවතුණි. මෙම ගබඩා වර්ග අඩියක් රු. 35 ක් රු. 70 ක් අතර මුදලකට කුලියට දී තිබුණි. | රටේ පවතින අයහපත් ආර්ථික තත්වය හේතුකොටගෙන ව්‍යාපාර පවත්වාගෙන යාමේ අර්බුදයක් පවතින අතර මෙම ගබඩා සියල්ලම නවීන පහසුකම් යටතේ අලුත්වැඩියා කිරීමට ආයතනය සැලසුම් කර තිබූ නමුත්, මුදල් අමාත්‍යාංශයට පවරා ගැනීමෙන් පසු විශාල ප්‍රාග්ධන වියදමක් දරා එවැනි කටයුතු සිදු නොකරන ලෙස උපදෙස් ලැබුණි. | ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේ දී බී.සී.සී ප්‍රධාන කාර්යාලයේ පැවති සබන් නිෂ්පාදන යන්ත්‍රාගාරය වතුපිටිවල අක්කර 03ක වපසරියක් යුක්ත ආයෝජන මණ්ඩල භූමිය වෙත ගෙන ගොස් ස්ථාපනය කර තිබුණද එය සවි කරන ලද දිනයේ සිට 2023 ඔක්තෝබර් 31 දින තෙක් | බී සී සී ආයතනයේ වතුපිටිවල කර්මාන්ත ශාලාවේ ස්ථාපිත කල සබන් නිමවුම් යන්ත්‍රය දැනට භාවිතා කරයි. නමුත් සබන් නූඩ්ලස් නිෂ්පාදන යන්ත්‍රය සවිකරනු ලැබුවත් එහි කටයුතු නියම ආකාරයෙන් අවසන් කර නැත. බී සී සී ආයතනය එහි ස්ථාපනය කල | භාවිතයට ගත නොහැකි යන්ත්‍ර සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | විට ඉදිරියේදී අවශ්‍ය කටයුතු කිරීමට බලාපොරොත්තු වෙයි. | |
| (ආ) | සමාගම සතුව වාහන 15 ක් පැවති අතර ඉන් 4 ක් (Land Vehicles හා Fork Lift ඇතුළුව) වර්ෂ 2 ත් වර්ෂ 4ක් අතර කාලයක සිට ධාවනයෙන් තොරව වාහන අංගනයේ රඳවා තිබුණි. | මෙම වාහන ධාවනයෙන් ඉවත් කර ඇති බැවින් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිව ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු යොදා ඇත. | භාවිතයට ගත නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 30 පරිදි 2006 වර්ෂයේ දී සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේදී මෙම චක්‍රලේඛය පරිදි එක් එක් වැටුප් පියවරයන්හි පිහිටුවා වැටුප් ගෙවා තිබුණද අදාළ බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් මේ දක්වා අනුමත කරවාගෙන නොතිබුණි. 2023 මාර්තු 31 දිනට ස්ථිර නිලධාරීන් 42 ක්, කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 6 ක් සේවයේ නියුක්තව සිටි අතර මිනිස් බල සැපයුම මගින් නිලධාරීන් 20 ක් 30 ක් අතර ප්‍රමාණයක් සමාගමේ රාජකාරි කටයුතු සඳහා අනුයුක්ත කර සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.8,518,702 ක්ද ගෙවා තිබුණි. | අවස්ථා කිහිපයකදීම ආයතනය කළමනාකරණය, අමාත්‍යාංශයේ නිර්දේශ ඇතිව බී සී සී ආයතනය සඳහා සේවක සංඛ්‍යාව හා බඳවා ගැනීමේ පටිපාටි අනුමත කර දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් පොල්තෙල් පිටතින් මිලදී ගෙන බෝතල් කිරීම හා කුලී ආදායම වැඩි කරගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් 2022/ 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර තිබුණි. මෙයට කාර්යයන් 5 ක් ඇතුළත් කර තිබුණු අතර ඉන් කාර්යයන් 4 ක ක්‍රියාකාරිත්වය සියයට 0 ක් වී තිබුණි. තවද වර්ෂය තුළ පිරිසිදු පොල්තෙල් (Pure Coconut Oil) නිෂ්පාදනය කිරීම එක් ක්‍රියාකාරකමක් ලෙස ඇතුළත් කර තිබුණද, සුදු පොල්තෙල් මිලදී ගෙන බෝතල් කිරීම පමණක් සිදු කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ පොල් තෙල් ආදායම රු.760,387,431 ක් වූ අතර එය අයවැයගත විකුණුම් ආදායමින් සියයට 85ක් විය. සමාගම අපේක්ෂා කළ පොල්තෙල් විකුණුම් ප්‍රමාණය මෙ.ටොන් 1279ක් වුවද ලහාකර ගත හැකි වී තිබුණේ මෙ.ටොන් 770 ක් පමණි. | රටතුල පැවති ආර්ථික අර්බුදකාරී තත්වය මත ඇති වූ විනිමය හිගතාවය, ඉන්ධන හිගතාවය සහ විදුලි අර්බුදය ආදී කටයුතු නිසා මහාභාණ්ඩාගාරය මගින් නව ආයෝජන කටයුතු නතර කරන ලෙස දන්වා චක්‍රලේඛයක් නිකුත් කර තිබීමෙන් ආයෝජන කටයුතු සිදුනොකරන ලදී. බොහෝ සේවකයින් ගෙදර රදවා දවස් කිහිපයක් පමණක් සේවයට පැමිණි නිසා මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කල නොහැකිවිය. කොප්පරා ගෙන්වීමට විදේශ විනිමය හිඟතාවය මත නතර විය. | සැළසුම් කළ පරිදි කාර්යයන් නිම කිරීමට කටයුතු කළ යුතුය. |